අත් පිටපත් සකස් කිරීම සඳහා උපදෙස්

01. මෙම සඟරාවේ පළ කිරීම සඳහා එවනු ලබන ලිපි මෙයට පෙර පළ නොවූ ඒවා විය යුතු අතර පළ කිරීම සඳහා වෙනත් ප්‍රකාශකයෙකුට බාර දුන් ඒවාද නොවිය යුතුය. එසේ ම මෙම සඟරාවේ පළ කිරීම සඳහා බාර දුන් ලිපි සංස්කාරක මණ්ඩලයේ අවසරයක් නොමැතිව වෙනත් ප්‍රකාශනයක පළ නො කළ යුතු වෙයි.

02. ලිපිවල ප්‍රමාණය පිළිබඳ සීමාවක් නොකෙරේ. එහෙත් වචන 5000ට ආසන්න ලිපි වඩාත් උචිතය.

03. අත් පිටපත් යතුරු ලියන හෝ පරිගණක ලිපි සැකැස්මෙන් ඉදිරිපත් කළ යුතු අතර පේළි දෙකක් අතර පරතර දෙකක් තබා (double space) පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය.

04. ලේඛකයාගේ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළත් කෙටිසටහනක් ද ලිපිය සමඟ එවිය යුතුය. (ආයතනික පර්යේෂකයින්ට අදාළ නොවේ.)

05. සෑම ලිපියක් සමඟම වචන 150කට නොවැඩි ප්‍රමාණයකින් යුතු සාරාංශයක් ද එවිය යුතුය.

06. පරිශීලනය කරන ලද ග්‍රන්ථ දැක්වීමේ දී විශේෂ අවධානයක් යොමු කළ යුතුය. ඒවා දැක්වීමේ පිළිගත් පිළිවෙත වන්නේ (1) පළමුවෙන් කතුවරයාගේ නම සඳහන් කර ඉන්පසු ඔහුගේ මුලකුරු දැක්වීම (2) මුද්‍රණය කළ වර්ෂය (3) ලිපියේ හෝ ග්‍රන්ථයේ නාමය (4) අවශ්‍ය නම් පළ වූ සඟරාවේ නම (5) වෙළුම මුද්‍රණය (එය ග්‍රන්ථයක් නම් ප්‍රකාශයට පත් කළ ස්ථානයේ හා ප්‍රකාශකයාගේ නම ) පිටු අංක ඇතුළුව පිළිවෙළින් දැක්වීමයි.

07. පළ කිරීම සඳහා බාර ගනු ලබන ලිපිවල හිමිකම් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට අයත් වෙයි. සෑම ලේඛකයෙකුටම ලිපිය පළ වූ කලාපයෙන් පිටපතක් හා එම ලිපියේ පිටපත් 10ක් නොමිලයේ සපයනු ලැබේ. ලේඛකයා විසින් විශේෂ ඉල්ලීමක් කරනු නොලැබුවහොත් පළ කිරීම සඳහා එවන අත් පිටපත් ආපසු එවනු නොලැබේ. (ආයතනික පර්යේෂකයින්ට අදාළ නොවේ.)

08. අත් පිටපතක් හා සම්බන්ධ ලිපි සංස්කාරක, ගොවි කටයුතු අධ්‍යයන ශාස්ත්‍රීය සඟරාව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, තැපෙ 1522, කොළඹ යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් ipo@harti.gov.lk යන විද්‍යුත් ලිපිනයට ද යොමු කළ හැකිය.